# සාර්ථක උඩවැඩියා වගාවකට අනුගමනය කළ යුතු පිළිවෙත්

**උඩවැඩියා වගාව අද දිවයිනෙ ජනප්‍රිය වගාවක් ලෙස ව්‍යාප්ත වෙමින්පවතී. වගා කිරීමේ පහසුවත්, හිතකර දේශගුණික සාධක, ඉතාහොඳ තත්වයේ පැල ලබා ගැනීමේ හැකියාව, අඩු වියදම් ක්‍රම, වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව යනාදි කරුණු නිසා බොහෝ දෙනා මෙම වගාවට වැඩි වැඩියෙන් යොමුවෙමින් පවතී. උඩවැඩියා වගාවේ මූලික සිධධාන්ත කරුණු කිහිපයක් මෙම ලිපියෙන් සාකච්ජා කිරිමට අපි බලාපොරොත්තු වෙමු.**

## 1. උඩවැඩියා වගාවට අවශ්‍ය දේශගුණික සාධක

**ඩෙන්ඩ්‍රෝබියම් සාමාන්‍ය වශයෙන් දිවා කල හොඳ තෙතමනයකින් යුතු උණුසුම් දේශගුණික පරිසරයක සාර්ථකව ව්‍යාප්තවේ.මෙම වර්ගය බොහෝ විට සෙල්සියස් අංශක 25-32 අතර උෂ්ණත්වයක් මත වැඩෙන අතර රාත්‍රී කාලයේදී උෂ්ණත්වය සෙල්සියස් අංශක15 ට වඩා අඩු නොවන ස්ථාන වියයුතුය. ඩෙන්ඩ්‍රෝබියම් වර්ග සඳහා එක එල්ලේ පතිත වන හිරු රශමියෙන් 50% ක්පමණ අවශ්‍යවේ. එක එල්ලේ පතිතවනදැඩි හිරුරැස් අවශ්‍ය පමණට පාලනය කර ගැනීම සඳහා නයිලෝන් දැල් භාවිතා කළ හැකිය. ඩෙන්ඩ්‍රෝබියම් ශාක නොයෙකුත්වර්ග සඳහා හිරු රැස් ලබා දීමේ ක්‍රමය වෙනස් වේ. මෙය පැහැදිලි කිරීමට ප්‍රමාණයක් දක්වතොත් ඩෙන්ඩ්‍රෝබියම් අතරමැදි වර්ගයකට එක එල්ලේ පතිතවන හිරුරශමියෙන් 50% ක් පමණ යෝග්‍ය වේ.**

**අවශ්‍ය තෙතමනය :- ආර්ද්‍රතාවයහෙවත් තෙතමනය 70%-75% දක්වා දිවා කාලයේ දී තිබෙන පළාත්වල ඩෙන්ඩ්‍රෝබියම්වර්ග වගා කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලබා ගත හැකිය. තද ශීත කාළගුණික තත්ව සහ අධික වැසි කාළ වලදී මෙම වර්ගයට විවිධආසාදන ඇතිවිය හැකිය.ඕනෑම උඩවැඩියා ශාකයකට ජලය සැපයීමේදී ජලයේ අන්තර්ගත ඇන්කලීන් සහ ඇසිටික් ප්‍රමාණය වගාවේ පැවැත්ම තීරණය කරයි. ලවණ තත්වය අධික ජලයයෙදීමෙන් වගාව විනාශ වී යා හැකිය.මේ නිසා ජලයේ අන්තර් ගත PH අගය මෙහිදීසලකා බැලිය යුතුය. වගාව සඳහා යොදන ජලය සාමාන්‍යයෙන් 05 PH හා 6.5 PH අතරඅගයකින් යුක්ත විය යුතුය.**

## 2.සෙවන ගෘහය

උඩවැඩියා ශාකයඋදෑසන හිරුඑළිය ප්‍රිය කරන ශාකයකි. සෘජුව ම උදෑසන හිරුඑළිය ලැබීමට සැලැස්වීම වැදගත් ය. එමෙන්ම දවසේ වැඩි කාලයක් හිරුඑළිය ලැබීම ශාකයට හිතකරය. එහෙත් දිවා කාලයේ හිරු එළිය ශාකයට සෘජුව ම ලැබුණ හොත් ශාකය පිළිස්සීයයි. එම නිසා පාලනයකින් යුතු ව ශාකයට හිරු එළිය පතිත විය යුතු ය. මේ සඳහාසෙවණ ලබා දෙන ආකාරය

ඉතා වැදගත් වේ. ප්‍රසස්ථ සෙවණ ප්‍රමාණය පහත සඳහන් වේ.
ඩෙන්ෙඩ්‍රාaබියම් **50%**
වැන්ඩා **50%**
ඔන්aසීඩියම් **50%**
කැටලියා **60%**
පැලනොප්සිස් **70%**

අවශ්‍ය කරන සෙවණ, උෂ්ණත්වය, ආර්ද්‍රතාව නිසි ලෙස සැපයීම සඳහා සෙවණ ශාකයක් තුළ උඩවැඩියා වගාව සාර්ථකව කළ හැකි ය.

සෙවණ ගෘහ නියමිත ආකාරයට ඉදි කර ගැනීම අවශ්‍ය ය. පොළොව මට්ටමේ සිට අඩි 10-12ක උසකින් දැල සකස් කර ගත යුතු වේ. දැල රැඳවීම සඳහා ජී.අයි.බට, එල්අයන් කොන්ක්‍රීට් කණු යොදා ගැනීම කාලයක් පැවතීමට හේතු වේ. දැව කණු යොදාගන්නේ නම් ඒවා ශක්තිමත් විය යුතු ය. කල් පැවතීම ගැන සලකා බැලීමේ දී දැවකණුවලට වඩා අනෙකුත් වර්ග යොදා ගැනීම සුදුසු ය.

පැළ ගෘහ තුළ තබා ගැනීම සඳහා මේස සකස් කළ යුතු ය. පොළොව මට්ටමේ සිට අඩි 2 1/2ක පමණ උසකින් පැළ රඳවා ගැනීම වඩාත් ම පහසු ය. පැළ රඳවන විට වැඩි ජලය බැසයන ලෙසත්, මුල්වලට වාතාශ්‍රය ලැබෙන ලෙසත් ඒවා තැන්පත් කිරීම අවශ්‍ය ය. මේකරුණු ගැන නිසි ලෙස සැලකිලිමත් නො වීම නිසා වගාවට හානි සිදු වේ. උඩවැඩියාශාකවල මුල් නිදහසේ එල්ලා වැටෙන ආකාරයට පැළ රැඳවීම අවශ්‍ය වේ.

**3. සුදුසු පැල තෝරා ගැනීම**

උඩවැඩියා වගාවක ආරම්භය හොඳ පැළවලින් සිදු කළ යුතු ය. වෙළෙඳපොළෙන් මිල දී ගැනීමට ඇති සාමූහික බඳුන් "Comport" ලෙස හඳුන්වයි. මේ බඳුනක පැළ 25-40 පමණ බොහෝ විට පවතී. විශ්වාසී ස්ථානයකින් පැළ ලබා ගැනීම ඉතා වැදගත් ය. ලාභයට ලබා දෙන පැළවලින් ගැටලු මතු විය හැකි ය.

Seeding ලෙසහඳුන්වන ආනයනික පැලද වෙළෙද පලෙහි පවතී. එම පැළතෝරා ගැනීමේදී පැලයේ උස ප්‍රමාණයට වඩා සැලකිලිමත් විය යුත්තේ පැළයෙහිනීරෝගි බවයි. පැළයෙහි බල්බය හොදින් වැඩි ඇත්දැයි සහ පත්‍ර කඳ නිරෝගි දැයි පරීක්ෂාකර බලා මිලදී ගත යුතුයි. සුදුසු නිරෝගී පැළ ඉක්මන් වර්ධනයන් ළගාකරගනී.

## 4. පැල සිටවීමට භාවිතාකරන මාධ්‍යය

බඳුන්වලට යොදන මාධ්‍යය ද උඩවැඩියා සඳහා ම විශේෂිත ය. අපිශාක ලෙස වගා කරනඋඩවැඩියා සඳහා අඟුරු සමග උළු කැබැලි,ගඩොල් කැබැලි ආදිය යොදා ගනියි. සමහරදෙනෙක් අඟුරු සමග පොල් ලෙලි කැබැලි ද යොදා ගනිති. මේ වගා මාධ්‍යයෙන්පැළවලට පෝෂණය සැපයීමක් සිදු නො වේ. එම නිසා මේ මාධ්‍ය යොදන විට හොඳින් ජලයබැස යන ලෙසත්,මුල්වලට වාතාශ්‍රය ලැබෙන ලෙසත් තෝරා ගැනීම අවශ්‍ය ය.

## 5.පැල බඳුන් ගත කිරීම/සිටවීම

පැල බඳුන් ගත කිරීමේදී භාවිතාකරන මාධ්‍ය දිලිරනාශක වල පොගවා වියලාගෙන භාවිතා කිරීම සුදුසුය. සිටවීමට ලබා ගන්නා පැල දිලිර නාශනයක ගිල්වා විනාඩි කිහිපයක් තබා මැරුණු මුල "සහ පත්‍ර ඉවත්කර ගන්න. බඳුනෙ "අඩියට කුඩා ප්‍රමාණයේ කලු ගල් කැබලි හෝ උළු කැට කැබලි කිහිපයක් දමන්න. පසුව පැලය බඳුන තුල තබා පොල්ලෙලි කැබලි කිහිපයක් පැලයට තඳවන ලෙස තබා වටයට අගරු සහ පොල්ලෙලි කැබලිදමා පැළය නොසෙල්වනලෙස තද කරන්න. අනවශ්‍යලෙස අගුරු හෝ පෙල්ලෙලි කැබළි වලින්බඳුන් සම්පූර්ණයෙන්ම නොපුරවන්න.

## 6. ජලය යෙදීම

පැළෑටිවලට ජලය යෙදීම ද සැලකිල්ලෙන් කළ යුතු ය. ජලයේ පිරිසිදු බව ද ඉතාවැදගත් ය. ළිං ජලය, වැසි ජලය යෝග්‍ය වන අතර ක්ලෝරීන් සහිත නළ ජලය වගාවටහිතකර නො වේ. නළ ජලය පැය 24ක පමණ කාලයක් වාතාශ්‍රයට නිරාවරණය කර තබාභාවිතයට ගත යුතු ය. ජලය යෙදීමට පෙර බඳුන් වියළි තත්ත්වයේ තිබිය යුතු ය.වැසි සහිත හෝ අඳුරු සහිත කාලගුණයක් පවතී නම් ජලය යෙදීම සුදුසු නො වේ.සාමාන්‍ය හිරු එළිය පවතින විට දවසට වරක් ද වියළි කාලගුණය පවතින විට දවසට දෙවරක් ද ජලය යෙදීම අවශ්‍ය වේ.

සාමානයෙන් ජලය යෙදිමට සුදුසු කාලයවන්නේ උයද වරුවේ 7-8 අතර හෝ සවස 3.30 - 4.00 අතරය. ජලය යෙදීම සඳහා Sprincles හෝ දියර ඉසිනයන් බාවිතා කල හැක.

## 7. පොහොර යෙදීම

සාමාන්‍යයෙන් උඩවැඩියා ශාකයට මුලිකවම අවශ්‍ය ප්‍රධාන මුලද්‍රව්‍ය 03 වන්නේ නයිට්‍රජන්( N ) පැස්පරස් සහ පොටැසියම් මෙම මුලධව්‍ය 03 විවිධ අනුපාතයන් වෙළද පොලෙහි පවතී. N මගින් ගසේ වර්ධනයට අවශ්‍යවන සාධකයන් වනඅතර P වලින් මූලපද්ධතිය වර්ධනයටත් K වලින මල් හට ගැනීම උත්තේජනයන් ප්‍රධාන වශයෙන් සිදුකරයි.

සාමානයෙන් උඩවැඩියා ගස්වලට දියර පොහෝර යෙදීම උචිතය ගැලුනයට එනම් ලීටර් 4.5 කට පොහොර තේහැදි 1½ -2 අතර යෙදිම නිවැරුදිය.

## පොහොර සහ දිලිර නාශක යොදන කාල සටහන

| දිනය | N.P.K (20:20:20) හෝ Albert Solution | N.P.K (10.30.10) | N.P.K ( 30:10:10) | දිලිරනගන Captan/Maecroseb |
|---|---|---|---|---|
| සඳුදා | ✓ | | | |
| අඟහරුවාදා | | | | |
| බදාද | | ✓ | | |
| බ්‍රහස්පතින්ද | | | | |
| සිකුරාදා | | | | |
| සෙනසුරාදා | | | ✓ | |
| ඉරිදා | | | | ✓ |

මීට අමතරව කාබනික දියර පොහොර මසකට වරක් හෝ දෙවරක් යොදාගත හැක.
වැසිසහිත කාලගුණික අවස්ථා වලදි කාබනික දියර පොහොර භාවිතා කිරීම නුසුදුසුයි.

- ❖ එමෙන්ම CANO3 ( කැල්සියම්නයිට්‍රේට්) ද මසකටවරක් භාවිතා කිරීම යොග්‍යයි.
- ❖ මල්හටගැනීමට ගස වැඩුනු පසු K වැඩි පොහොරත් එකතු කර ගන්න.

## දිලිර සහ පලිබොධනාශක

- ❖ සති 2 න් 2 ට දිලිරනාශකයන් යෙදීම සුදුසුයි.
  වැසිකාල වලදී දිලිර වර්ධනය වැඩිවීමත් පෙන්නුම් කරන අතර එවැනි අවස්ථා වලදී සතියට වරක් යෙදීම සුදුසුය. එකම දිලිරනාශකය දිගටම පාවිච්චි නොකර එය මාරු කරමින් යොදන්න.( Mercroseb, Topsin)සහ වෙළඳ පොලෙහි ඔනෑම දිලිරනා ශකයක් උචිත වේ. අසුරුමේ සඳහන් ආකාරයට ප්‍රමාණයන් නිශ්චිත කර ගන්න.
- ❖ පලිබෝධ නාශක අවශ්‍යය අවස්ථා වලදී යොදා ගන්න.
- ❖ මසකට වරක් පලිබෝධ නාශක යෙදීම සාමානයෙන් සුදුසුය.